සිංහල රීතිය - 9

# පද බෙදීම


දේශමාන්‍ය

සාහිත්‍ය සූරි

සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය


(C) Sumitha Publishers

**සුමිත පොතක්**

# සිංහල රීතිය

සමාජය යනු මිනිසුන්ගේ එකතුවකි. සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ මූලික කරුණු දෙකක් මත ය. පළමුවැන්න, එහි පවත්නා 'නීති' සමුදාය යි. දෙවැන්න, එහි පවත්නා 'රීති' සමුදාය යි. නීතියක් රීතියක් නැති සමාජය අවුලින් අවුලට පත් වේ. නීති හා රීති අතර පවත්නා මූලික වෙනස්කම් හඳුනා ගැනීම භාෂාවේ ස්වභාවය හඳුනා ගැනීමට මහත් සේ උපකාරී වේ.

විවාහය පිළිබඳව නීති පද්ධතියක් මෙන් ම රීති පද්ධතියක් ද ඇත. විවාහ වන දෙදෙනාගේ වයස් සීමාව ගැන නීතියක් ඇත. විවාහ වන දා මනමාලිය පෝරුවෙහි සිට ගත යුත්තේ කෙසේ ද යන්න ගැන නීතියක් නැත. එහෙත් ඈ සිට ගත යුත්තේ මනමාලයාගේ වම් අත පැත්තෙහි ය යනුවෙන් රීතියක් ඇත. විවාහ වන දාට 'ජය මංගල ගාථා' කියා ආශීර්වාද කළ යුතු යැයි නීතියක් නැතත් රීතියක් ඇත.

නීති හා රීති අතර මූලික වෙනස්කම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, නීති හා රීති උපදින ආකාරය යි. නීතියක් උපදින්නේ එය කිසියම් බලධර මණ්ඩලයක් විසින් පනවනු ලැබීමෙනි. මේ බලය බොහෝ විට පැවරෙන්නේ පාර්ලිමේන්තුවට හෙවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ය. රීතියක් උපදින්නේ පාර්ලිමේන්තුව වැනි බලධර මණ්ඩලයකින් නොව මුළු මහත් සමාජයෙනි. මඟුල් පෝරුවේ සිරිත් විරිත් සම්මත කොට ගෙන ඇත්තේ ආඥා පනතකින් නොව මුළු මහත් සමාජය විසිනි.

දෙවැන්න, නීති හා රීති සංග්‍රහ කොට ඇති ආකාරය යි. සමාජයකට බල පාන ඒ ඒ නීති කිසියම් ලේඛනයක සංග්‍රහ කොට ඇත. විවාහයට අදාළ සියලු නීති විවාහ ආඥා පනතෙහි ලේඛනගත කොට ඇත. වගන්ති හා උපවගන්ති වශයෙන් ඒ නීති ඉදිරිපත් කෙරේ. එහෙත් විවාහයට අදාළ සිරිත් විරිත් හෙවත් රීති ඇතුළත් ලේඛනයක් නැත.

තෙවැන්න, නීති හා රීති උල්ලංඝනය කළ විට ඇති වන විපාක යි. නීතියක් බින්ද විට එය දඬුවම් ලැබිය යුතු වරදක් වේ. දඬුවම් පැමිණවීම පොලිසියෙහිත් උසාවියෙහිත් කාර්ය භාරය යි. එහෙත් රීතියක් බිඳුණු විට පොලිසියෙන් හෝ උසාවියෙන් දඬුවම් පැමිණෙන්නේ නැත. මඟුලක් නොකා විවාහයක් කර ගත හොත් ඉන් පොලිසියට ප්‍රශ්නයක් නැතත් සමාජයට ප්‍රශ්නයක් ඇත. එසේ කරන්නට ඇත්තේ ඇයි දැයි සමාජය විමසන්නට පටන් ගනී. ඒ අනුව නොයෙක් කටකතා පැතිර යනු ඇත. එයින් වන අපහාසය උසාවියෙන් ලැබෙන දඬුවමට වඩා බරපතල විය හැකි ය.

භාෂාව සැදී ඇත්තේ නීති පද්ධතියකින් නොව **රීති පද්ධතියකින්** බව අවධාරණය කළ යුතු ය. සිංහලයෙහි අකුරු යෙදිය යුත්තේ මෙසේ යැයි කියා හෝ පද සන්ධි කළ යුත්තේ මෙසේ යැයි කියා හෝ පද හෝ වාක්‍ය සදා ගත යුත්තේ මෙසේ යැයි කියා හෝ නීතියක් නැත. එසේ කළ යුත්තේ අසවල් ආඥා පනතෙහි එන අසවල් වගන්තිය අනුව යැයි කිව නොහේ.

එසේ වුවද නිවැරදිව අකුරු යෙදිය යුතු ආකාරය (අක්ෂර වින්‍යාසය), පද සන්ධි කළ යුතු ආකාරය (අක්ෂර සුසංයෝගය), පද සදා ගත යුතු ආකාරය (පද නිර්මාණය) හා වාක්‍ය සදා ගත කළ යුතු ආකාරය (වාක්‍ය නිර්මාණය) පිළිබඳව රීති පද්ධතියක් ඇත. මේ රීති පනවන ලද්දේ බලධරයන් විසින් නොව භාෂාව භාවිත කරන්නන් විසිනි.

භාෂාවක භාවිතය අළලා පවතින රීති පද්ධතිය 'ව්‍යාකරණය' නම් වේ. මේ රීති කලින් කලට වෙනස් වෙමින් පරිණාමයට පත් වේ. එබැවින් ඒ ඒ කාල පරිච්ඡේදවල පවත්නා ව්‍යාකරණ රීති කවරේ දැයි ව්‍යවහාරානුසාරයෙන් විමසා බැලීම වාග්විද්‍යාඥයාගෙත් ව්‍යාකරණඥයාගෙත් වගකීම වේ.

'සිංහල රීතිය' නමැති මේ පොත් පෙළේ අරමුණ සමකාලීන සමාජයෙහි සිංහල භාෂාව භාවිත වන ආකාරය විද්‍යාත්මකව විමසා බලා ඊට අදාළ රීති සමුදාය කෙබඳු දැයි විධිමත්ව හෙළි පෙහෙළි කිරීම යි. එසේ කිරීමෙන් සමකාලීන සිංහලයන් සිතන පතන ආකාරය හඳුනා ගැනීමට සිංහල පාඨක ලෝකයාට හැකි වනු ඇත.

(C) Sumitha Publishers

# පෙර වදන

'පද බෙදීම' නමැති මේ පොත 'සිංහල රීතිය' නමැති පොත් පෙළේ නවවැන්න යි. මෙහි අරමුණ යමක් ලියන විට පද බෙදා වෙන් කරන ආකාරය පැහැදිලි කිරීම යි. පද බෙදීම මූලික වශයෙන් අවශ්‍ය වන්නේ කියවීමේ පහසුව තකා ය. දිගු පද කීපයක් එකට ලියූ විට එය කියවීම බෙහෙවින් අපහසු වන හෙයිනි.

එබැවින් එක් වරකට ඇසට හසු වන ප්‍රමාණයට පද එක් කොට ලිවීම කියවීම සුවදායී කරයි. ලේඛක ලේඛිකාවන් කළ යුත්තේ පාඨකයාගේ පහසුව සලකා පද බෙදීමේ කාර්යයට අත ගැසීම යි. පහත දැක්වෙන යෙදුම් කියවීම මඳක් අසීරු යැයි සිතේ.

කන්කෙඳිරිගායි

කඩාකප්පල්කරයි

කුඩුපට්ටම්කරයි

සණ්ඩුසරුවල්කරති

ඒ පද පහත දැක්වෙන විධියට බෙදා වෙන් කොට ලියුව හොත් කියවීම පහසු නොවේ ද?

කන් කෙඳිරි ගායි

කඩා කප්පල් කරයි

කුඩු පට්ටම් කරයි

සණ්ඩු සරුවල් කරති

එබැවින් පද බෙදීමේ අවසන් අරමුණ විය යුත්තේ පාඨකයා නොවෙහෙසවා කියවීමට සැලැස්සීම යි.

පද බෙදීම අළලා වෙන ම පොතක් ලිවීමට මා පොලඹවන ලද්දේ දෙ කරුණක් විසිනි.

පළමුවැන්න, විභාග ප්‍රශ්න පත්‍රවල සාරාංශ ලිවීමෙහි දී මතු වන ගැටලුව යි. සාරාංශ ලියන විට දෙන එක් උපදෙසක් නම් එහි ඇති 'පද සංඛ්‍යාව' සඳහන් කිරීම යි. මේ පද සංඛ්‍යාව තීරණය වන්නේ පද බෙදා ඇති ආකාරය අනුව ය. එක ම පදය කීප විධියකට බෙදා ලිවිය හැකි නම් සාරාංශයෙහි ඇති පද සංඛ්‍යාව අවිධිමත්ව වෙනස් වනු ඇත.

මෑතක සිට පොදු සහතික පත්‍ර උසස් පෙළ නිර්දේශ මාලාවෙහි ද එක් තේමාවක් හැටියට 'පද බෙදීම' නිර්දේශ කොට ඇති බව දැන ගැනීමට ලැබිණ. උසස් පෙළ විභාගය සමත් වන ශිෂ්‍යයන් නිවැරදිව පද බෙදන ආකාරය දැන සිටිය යුතු බව ඇත්ත ය. එහෙත් පද බෙදීම අළලා වියතුන් අතර ද මත භේද ඇති කල්හි ඒ අළලා ප්‍රශ්න ඇතුළත් කිරීම කොතරම් සාධාරණ දැයි සිතා බැලිය යුතු ය

(C) Sumitha Publishers

පද බෙදීම අළලා එක ම පොදු සම්මතයක් ඇති කොට ගැනීම දුෂ්කර කාර්යයක් වේ. වියතුන් අතර ම පවත්නා මත වාද හා මත භේද නිසා ය. වියතුන් විවිධ ගුරු කුලවලට අයත් වන නිසා සිය ගුරු කුලය අනුදක්නා රීති වෙනස් කිරීමට ඔවුහු කිසිසේත් එකඟ නොවෙති.

එහෙත් එදිනෙදා ලේඛන කටයුතු ප්‍රායෝගිකව ඉටු කොට ගැනීම පිණිස මේ පොතේ එන රීති පොදු පාඨකයාට උපකාරි වනු ඇතැයි විශ්වාස කරමි. 'පද බෙදීම' පිළිබඳ පොදු සම්මතයක් අනාගතයෙහි දී ඇති කොට ගැනීමට මේ පොත ඉවහල් වුව හොත් එය මගේ අමන්දානන්දයට හේතු වේ.

මේ පොත ලිවීමෙහි ලා ආචාර්ය සඳගෝමි කෝපරහේවාගෙන් ලැබුණු අනුග්‍රහය බෙහෙවින් අගය කරමි.

**ජේ. බී දිසානායක**

2 ඒ පීටර්ස් පෙදෙස, නුගේගොඩ.

# පටුන


1. පද බෙදීම 7

2. පද බෙදීමේ රීති 8

**1. වෙන් කොට ලිවිය යුතු පද**

3. ක්‍රියා පද 12

4. පූර්ව ක්‍රියා පද 16

5. නිපාත පද 18

6. නිපාත නාම පද 20

**2. එක් කොට ලිවිය යුතු පදාණු**

7. උපසර්ග 24

8. තද්ධිත ප්‍රත්‍ය 26

9. ගුණ ප්‍රත්‍ය 28

10. විභක්ති ප්‍රත්‍ය 30

**3. එක් කොට ලිවිය යුතු පද**

11. පුද්ගල සංඥා නාම 36

12. පැවදි සංඥා නාම 39

13. රාජකීය සංඥා නාම 40

14. ස්ථාන සංඥා නාම 42

15. සංඛ්‍යා නාම පද 46

**4. එක් කොට හෝ වෙන් කොට ලිවිය හැකි පද**

16. සාධිත ක්‍රියා පද 50

17. තනි අකුරේ නිපාත 52

18. ‘නො’ නිපාතය හා උපසර්ග 54

19. විලාස පද 56

20. සමාස නාම පද 58

21. යුගළ පද 64

**5. වරදවා වෙන් කොට ලියන පද**

22. සාවද්‍ය පද බෙදීම් 66


(C) Sumitha Publishers

# 1.
# පද බෙදීම

අප අදහස් පළ කරන්නේ වාක්‍යවලින් ය. වාක්‍යයක් සැදෙන්නේ පද කීපයක් එක් වීමෙන් ය. මේ පද පහසුවෙන් කියවීමට හැකි වන පරිදි එකිනෙකින් වෙන් කොට ලිවීම **'පද බෙදීම'** නම් වේ. පහත දැක්වෙන වාක්‍යය කියවීම තරමක් අපහසු ය.

මිනිස්සුකන්නලවුකරනවා

එහෙත් එහි ඇති පද බෙදා වෙන් කොට ලියුව හොත් එය කියවීම පහසු වනු ඇත.

මිනිස්සු කන්නලවු කරනවා

පද බෙදා ලිවීමේ රීති බිහි වූයේ මුද්‍රණ යන්ත්‍රය මෙරටට හඳුන්වා දීමෙන් පසුව ය. ඊට කලින් පුස් කොළවල ලියන විට පද බෙදා ලිවීමේ සිරිතක් නොවිණ. පුස් කොළ සීමාසහිත වූ නිසා ඒවායෙහි වැඩිවැඩියෙන් ලිවීම පත් ඉරු ලියන්නාගේ අරමුණ විය. එබැවින් සියලු පද එක් කොට ලිවීම ඔහුගේ රීතිය විය.

පද බෙදීමේ රීති මුලින් ම සදා ගන්නා ලද්දේ සිංහල මුද්‍රණ ශිල්පීන් විසිනි. මුද්‍රණ යන්ත්‍රය නිසා ලිවීම පුස් කොළයෙන් කඩදාසියට මාරු විණ. මෙරට සිටි ලන්දේසීන් හා ඉංග්‍රීසීන් මුද්‍රණ කටයුතු කරන විට පද බෙදා ලියූ සැටි දැන සිටි සිංහල මුද්‍රණ ශිල්පීහු ද තම තම නැණ පමණින් පද බෙදීමේ රීති නිපදවා ගත්හ.

පද බෙදීම පිළිබඳ පොදු සම්මතයක් තවමත් බිහි වී නැත.ඒ ඒ ගුරු කුලවලට අයත් ලේඛක ලේඛිකාවෝ විවිධ හේතු සාධක පාදක කොට ගනිමින් විවිධ ආකාරයෙන් පද බෙදා ලියති.

පද බෙදීම අරබයා පොදු රීතියක් බිහි කොට ගැනීමට අප අසමත් වී සිටින්නේ **'පද'** යන සංකල්පය පිළිබඳව අප අතර පවත්නා මත භේද යි. සිංහලයෙහි පද වර්ග කොපමණක් වේ ද යනු පළමුවන ගැටලුව යි. 'උපසර්ග' යනුවෙන් පද වර්ගයක් ඇතැයි ඇතැම් වියරණ ඇදුරන් කියන අතර සමහරු ඊට විරුද්ධ වෙති.

දෙවෙනි ගැටලුව ඇතැම් භාෂාංග පද වර්ගයක් ප්‍රත්‍ය වර්ගයක් ද යන විනිශ්චය යි. 'ගේ' හා 'ගෙන්' යන භාෂාංග 'විභක්ති ප්‍රත්‍ය' වශයෙන් සැලකීම කාලාන්තරයක් තිස්සේ පැවත එන සම්ප්‍රදාය යි. එහෙත් ඒවා 'නිපාත පද' වශයෙන් සැලකීම මෑතක දී ඇති වුණු සම්ප්‍රදායකි.

පද බෙදීම පිළිබඳ පොදු සම්මතයක් නැති නිසා ඒ ඒ ලේඛකයෝ තම තමන්ගේ අවබෝධය අනුව විවිධ ලෙස පද බෙදා ලියති. ඒ ගැන කිසිදු අවබෝධයක් නැත්තෝ ඒ කාර්යය සෝදු පත් බලන්නන්ට පවරති. සෝදු පත් බලන බොහෝ දෙනා වියතුන් නොවන නිසා තම තම නැණ පමණින් පද බෙදා දෙති.

එබැවින් සිංහල ලේඛක ලේඛිකාවන්ගේ ප්‍රයෝජනය තකා පද බෙදීම පිළිබඳ පොදු සම්මතයක් බිහි කිරීම අද අවශ්‍යයෙන් ම සිදු කළ යුත්තකි. මේ පොතේ අරමුණ එවැනි පොදු සම්මතයකට මඟ පාදා දීම යි.

පද බෙදීම පිළිබඳ රීති සිව්වැදෑරුම් වේ:

1. වෙන් කොට ලිවිය යුතු පද
2. එක් කොට ලිවිය යුතු පදාණු
3. එක් කොට ලිවිය යුතු පද
4. එක් කොට හෝ වෙන් කොට හෝ ලිවිය යුතු පද

(C) Sumitha Publishers

# 2.
# පද බෙදීමේ රීති

පද බෙදීමෙහි දී සිදු වන්නේ වාක්‍යයක එන 'පද' බෙදා වෙන් කොට ලිවීම නිසා මුලින් ම කළ යුත්තේ 'පද' යනු මොනවා දැයි දැන හඳුනා ගැනීම යි. සිංහලයෙහි පද වර්ග හතරක් ඇතැයි පැරණි වියරණ පොත්වල සඳහන් වී ඇත. ඒ මෙසේ ය.

නාම පද

ක්‍රියා පද

නිපාත පද

උපසර්ග පද

පසුව මේ සංඛ්‍යාව තුනට අඩු විණ. 'උපසර්ග' පද වර්ගයක් නොවන බව සැලකුණු නිසා එය පද අතුරින් ඉවත් කෙරිණ. 'නිපාත පද' යන නම වෙනුවට 'අව්‍යය පද' යන නම වහරට ගැනිණ.

(C) Sumitha Publishers

මේ පද අතරට තවත් පද දෙ වර්ගයක් පසුව එක් විණි. ඒ පද මෙසේ හැඳින්විණ.

නාම විශේෂණ පද

ක්‍රියා විශේෂණ පද

මේ පද දෙ වර්ගය හඳුන්වනු පිණිස කෙටි නම් දෙකක් මා විසින් වහරට ගනු ලැබිණ.

1. ගුණ පද (නාම විශේෂණ පද)
2. විලාස පද (ක්‍රියා විශේෂණ පද)

**'පද'** නමැති භාෂාංග සෑදෙන්නේ ඊට වඩා කුඩා භාෂාංග එක් වීමෙනි. මේ කුඩා භාෂාංග වර්ගය හැඳින්වීමට **'පදාණු'** යන නම යෙදිය හැකි ය.'පදයක ඇති අණු කොටස්' යන අර්ථයෙනි. 'පදාණු'සංයෝග කිරීමෙන් 'පද' සදා ගනු ලැබේ.

පද නිර්මාණයෙහි ලා යොදා ගන්නා පදාණු සියල්ල සතර වර්ගයකට අයත් වේ.

ප්‍රකෘති

ප්‍රත්‍ය

තද්ධිත

උපසර්ග

'පදාණු' යොදා 'පද' නිර්මාණය කිරීමෙහි ලා අද භාවිත වෙන රීති පිළිබඳ පූර්ණ විවරණයක් මේ පොත් පෙළේ 'පද නිර්මාණය' නමැති කාණ්ඩයෙහි ඇතුළත් වේ.

පද බෙදීමේ දී සිතට ගත යුතු කරුණු දෙකකි.

පළමුවැන්න, පහත දැක්වෙන පද එකිනෙකින් **වෙන් කොට** ලිවීම ය.

1. නාම පද
2. ක්‍රියා පද
3. ගුණ පද
4. විලාස පද
5. නිපාත පද

පහත දැක්වෙන්නේ පද වෙන් නොකළ වාක්‍යයකි:

'උපකුලපතිවරයා තරුණ මාධ්‍යවේදීන් සාදරයෙන් අමතයි'

යට කී පද වර්ග හඳුනා ගත හැකි නම් මේ වාක්‍යයෙහි පද පහක් ඇතුළත් වන බව පැහැදිලි ය. එබැවින් එය මෙසේ පදවලට බෙදා වෙන් කළ හැකි ය.

'උපකුලපතිවරයා තරුණ මාධ්‍යවේදීන් සාදරයෙන් අමතයි'

දෙවැන්න, පහත දැක්වෙන පදාණු **එක් කොට** ලිවීම

1. ප්‍රකෘති පදාණු
2. ප්‍රත්‍යය පදාණු
3. තද්ධිත පදාණු
4. උපසර්ග පදාණු

'උපකුලපතිවරයා' යනු නාම පදයකි. ඒ නාම පදය සෑදෙන්නේ පදාණු පහක එකතුවෙනි. ඒ පදාණු එක් කොට ම ලිවිය යුතු ය :

උප

කුල

පති

වර

ආ

'මාධ්‍යවේදීන්' යනුත් නාම පදයකි. ඒ නාම පදය සෑදෙන්නේ පදාණු තුනක එකතුවෙනි. ඒ පදාණු එක් කොට ම ලිවිය යුතු ය.

මාධ්‍ය

වේදි

ඉන්

'අමතයි' වනු ක්‍රියා පදයකි. ඒ ක්‍රියා පදය සෑදෙන්නේ පදාණු දෙකක එකතුවෙනි. ඒ පදාණු එක් කොට ම ලිවිය යුතු ය.

අමත

යි

'තරුණ' යනු ගුණ පදයකි. එහි ඇත්තේ 'තරුණ' යන ප්‍රකෘති පදාණුව පමණකි

තරුණ

'සාදරයෙන්' යනු විලාස පදයකි. එය සෑදෙන්නේ පදාණු දෙකක එකතුවෙනි:

ස

ආදරයෙන්

පද බෙදීම පිළිබඳ රීති සිව්වැදෑරුම් වේ:

1. වෙන් කොට ලිවිය යුතු පද
2. එක් කොට ලිවිය යුතු පදාණු
3. එක් කොට ලිවිය යුතු පද
4. එක් කොට හෝ වෙන් කොට හෝ ලිවිය යුතු පද

(C) Sumitha Publishers

# 1. වෙන් කොට ලිවිය යුතු පද

(C) Sumitha Publishers